# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1487/5 – 2007 මාර්තු 05 වැනි සඳුදා– 2007.03.05

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2006 අංක 10 දරන දේශීය ආදායම් පනත**

108 (1) (ආ) වගන්තිය යටතේ දැන්වීම

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 108 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර වැඩබලන මුදල් අමාත්‍ය රංජිත් සියඹලාපිටිය වන මම, මෙහි උපලේඛනයෙහි දක්වා ඇති ගණුදෙනු ඒ වගන්තියේ කාර්ය සඳහා වූ ගණුදෙනු ලෙස මෙම දැන්වීමෙන් ප්‍රකාශ කරමි.

රංජිත් සියඹලාපිටිය,
වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2007 මාර්තු 01 වැනි දින,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,
කොළඹ දී ය.

උපලේඛනය

1. දේපලවලට අදාල පහත දැක්වෙන ගණුදෙනු

(අ) යම් නිශ්චල දේපලක් පැවරීම, උකස් කිරීම, බදුදීම හෝ ත්‍යාග කිරීම සඳහා නොතාරිස්වරයකු විසින් ලියා අත්සන් කරන ලද සියළු ගණුදෙනු ;

(ආ) යම් නිවාස ස්ථානයක් හෝ වානිජ ස්ථානයක් කුලියට හෝ බදු දීම සඳහා නොතාරිස්වරයෙකු විසින් ලියා අත්සන් කරන ලද සියළු ගනුදෙණු ;

(ඇ) යම් චංචල දේපලක් කුලියට දීම, විකිණීම හෝ බදුදීම සඳහා නොතාරිස්වරයෙකු විසින් ලියා අත්සන් කරන ලද සියළු ගණුදෙනු ;

2. වාහන ලියාපදිංචි කිරීම, පැවරීම හෝ උකස් කිරීම සඳහා මෝටර් වාහන රෙජිස්ට්‍රාර්වරයා සමඟ වූ සියළු ගණුදෙනු.

3. (අ) ජංගම ගිණුම් විවෘත කිරීම සඳහා ;

(ආ) ස්ථාවර තැන්පතු විවෘත කිරීම සඳහා ;

(ඇ) ණය සඳහා ;

(ඈ) විනිමය බිල්පත්‍රයක් වට්ටම් කිරීම සඳහා ;

(ඉ) ණයවර ලිපියක් සඳහා ;

(ඊ) භාර කුවිතාන්සි, පොරොන්දු නෝට්ටු සහ ඔඩපනය සඳහා

බැංකු, මූල්‍ය ආයතන සහ මුදල් ණයට දෙන්නන් සමඟ වන ගණුදෙනු,

4. කොටස් සහ සෘණ පත්‍ර මිලට ගැනීම සහ විකිණීම සඳහා වූ ගණුදෙනු ;

5. ව්‍යාපාර ලියාපදිංචි කිරීම සඳහා වූ ගණුදෙනු ;

6. වර්ෂයකට රුපියල් ලක්ෂයක් හෝ ඊට වැඩි වටිනාකමක් ඇති වෘත්තීය හෝ වෙනත් සේවාවන් සැලසීම සඳහා වූ ගණුදෙනු ;

7. ගොඩනැගිලි අවසරපත්‍ර සහ බලපත්‍ර සඳහා පළාත් පාලන ආයතන සමඟ වූ ගණුදෙනු ;

8. පෞද්ගලික කෝච් රථ ධාවනය කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීමට ජාතික ප්‍රවාහන කොමිසම සමඟ වූ ගණුදෙනු ;

9. වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙන යන අතරතුර හැර වටිනාකම රුපියල් විසිපන්දහසකට වැඩි බඩු විකිණීම සඳහා වූ ගණුදෙනු ;

03 – 599

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.